සිත සමාධිමත් වූ කල්හි එම ධර්මතාවන් පිළිබඳව විවිධාකාරයෙන් නුවණින් විමසා බලයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ධම්මවිචය සම්බොජ්ඣංගය වැඩෙයි. එනම් සතිමත් වූ සිතින් පටිච්චසමුප්පන්නාදි වශයෙන් ධර්මය ගැඹුරින් නුවණින් විමසා බැලීම නිසා ධම්මවිචය සම්බොජ්ඣංගය පරිපූර්ණත්වයට පත්වීමයි. මෙලෙස දහම නුවණින් විමසා බලන කල්හි ධෛර්යවත්ව ධර්ම මාර්ගයෙහි ඉදිරියට වීර්යයක් හටගනී. විරිය සම්බොජ්ඣංගය පරිපූර්ණත්වයට පත්වන්නේ මේ අයුරිනි. මෙසේ අකුසලයෙන් දුරුව වීර්යෙන් කුසලයෙහි දැඩිව යෙදෙන කල්හි නිරාමිස ප්‍රීතියක් හටගනී. එය පීති සම්බොජ්ඣංග නම් වේ. ඒ අනුව පීති සම්බොජ්ඣංගය වඩයි. එවිට එම තැනැත්තාගේ පීති සම්බොජ්ඣංගය භාවනාවෙන් පරිපූර්ණත්වයට පත් වෙයි. ප්‍රීති සිත් ඇත්තාගේ මනස ද සිත ද සන්සිඳෙයි (පීතිමනස්ස කායොපි පස්සම්භති, චිත්තම්පි පස්සම්භති). මෙලෙස මනස හා සිත සන්සිඳුණු කල්හි ඔහුගේ පස්සද්ධි සම්බොජ්ඣංගය වැඩෙයි. එනම් කයෙහි සැහැල්ලු භාවය නම් වූ පස්සද්ධි සම්බොජ්ඣංගය පරිපූර්ණත්වයට පත්වීමයි. කය සැහැල්ලු වූ කල්හි සිත සමාධිමත් වීම් වශයෙන් සමාධි සම්බොජ්ඣංගය වැඩෙයි. එකල්හි සමාධියෙහි පරිපූර්ණත්වයට පත් වෙයි. සමාහිතො භික්ඛවේ යථාභූතං පජානාති යනුවෙන් දක්වා ඇති පරිදි සිත සමාධිමත් වූ කල්හි හේතුඵල දහම්හි අවබෝධයෙන් යුතු සම්මාදිට්ඨිය පෙරටුකොට දහම් වැඩූ ශ්‍රාවකයාට අනිත්‍යාදි වශයෙන් ලෝක යථාර්ථය අවබෝධ වීම නිසා සිත උපේක්ෂාවෙහි පිහිටයි. එනම් උපෙක්ඛා සම්බොජ්ඣංගය වැඩී එහි භාවනා වශයෙන් පරිපූර්ණත්වයට පත් වේ. මෙලෙස ආනාපානසතියෙහි මුල් පියවර හතර වූ කායානුපස්සනා කොටස වැඩීමේ ප්‍රතිඵල වශයෙන් ක්‍රමයෙන් සති සම්බොජ්ඣංග ආදි බොජ්ඣංග ධර්ම වැඩෙන අයුරු දැක ගත හැකිය. මේ තත්ත්වය ක්ෂණිකව ඇති වන්නක් නොව බුදුරදුන් වදාළ පරිදි ආනාපානසතියෙහි යළි යළිත් සිත භාවිත කිරීමෙන් ලැබෙන ප්‍රතිඵලයකි.

කය පිළිබඳ අවබෝධය දියුණු කරමින් තවදුරටත් ආනාපානසතියෙහි යෙදෙන ශ්‍රාවකයා තුළ වේදනාව පිළිබඳව ද අවබෝධය ප්‍රකට වේ.

ඒ අනුව,

5. මානසික ප්‍රීතිය-සතුට දැන ගනිමින් ආශ්වාස කරමි'යි හික්මෙයි.

(*පීතිපටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති.*)

මානසික ප්‍රීතිය-සතුට දැන ගනිමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.

(*පීතිපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති.*)

6. කායික සුවය දැන ගනිමින් ආශ්වාස කරමි'යි හික්මෙයි.

(*සුඛපටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති.*)

කායික සුවය දැන ගනිමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.

(*සුඛපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති.*)

7. චිත්තසංඛාර හෙවත් සඤ්ඤා-වේදනා දැන ගනිමින් ආශ්වාස කරමි'යි හික්මෙයි.

(*චිත්තසඞ්ඛාරපටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති.*)

චිත්තසංඛාර (සඤ්ඤා-වේදනා) දැන ගනිමින් ප්‍රශ්වාස කරමි’යි හික්මෙයි.
(*චිත්තසඞ්ඛාරපටිසංවෙදී පස්සසිස්සාමී’ති සික්ඛති.*)
8. චිත්තසංඛාර (සඤ්ඤා-වේදනා) සංසිඳීම දැන ගනිමින් ආශ්වාස කරමි’යි හික්මෙයි.
(*පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සසිස්සාමී’ති සික්ඛති.*)
චිත්තසංඛාර (සඤ්ඤා-වේදනා) සංසිඳීම දැන ගනිමින් ප්‍රශ්වාස කරමි’යි හික්මෙයි.
(*පස්සම්භයං චිත්තසඞ්ඛාරං පස්සසිස්සාමී’ති සික්ඛති.*)

ආනාපානසතිය වැඩීමේ දෙවන කොටස වූ මෙම පියවර හතරින් විස්තර වන්නේ ඇස්, කන් නාසාදි ඉන්ද්‍රිය හය ඔස්සේ ලැබෙන වේදනා, සඤ්ඤා පිළිබඳ අවබෝධය සහිත සතිමත් බව දියුණුකිරීමයි. වේදනාවන් අතර ආශ්වාස-ප්‍රශ්වාස ක්‍රියාවලිය එක්තරා වේදනාවක් වශයෙන් සූත්‍රයෙහි දක්වා තිබේ (වේදනාසු වේදනාඤ්ඤතරාහං භික්ඛවේ, එවං වදාමි : යදිදං අස්සාසපස්සාසානං සාධුකං මනසිකාරං). මෙලෙස මනා දැනුමෙන් යුතුව ආනාපානසතිය වැඩමේ දී ක්‍රමයෙන් සඤ්ඤා, වේදනා ස්කන්ධ පිළිබඳ සිහිය හා නුවණ දියුණුවට පත් වෙමින් සතිමත් බව වඩ වඩාත් ශක්තිමත් වේ. මෙහි දී වේදනාස්කන්ධය ප්‍රකට වන අතර ස්පර්ශ ආහාරය පිළිබඳ අවබෝධය ද දියුණු වේ.

ආනාපානසති සූත්‍රයෙහි දැක්වෙන පරිදි මෙලෙස ආශ්වාස ප්‍රශ්වාස කිරීම වේදනාවන් අතර එක්තරා වේදනාවක් වශයෙන් සඳහන් කොට තිබේ. මෙලෙස ආනාපානසති භාවනාව ඔස්සේ කායානුපස්සනාව තුළ සිත සමාධිමත් වූ කල්හි බොජ්ඣංග ධර්ම තවදුරටත් දියුණුවීම් වශයෙන් වේදනාව හා සම්බන්ධ ධර්මතාවන් පිළිබඳව විවිධාකාරයෙන් නුවණින් විමසා බලයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ධම්මවිචය සම්බොජ්ඣංගය වැඩෙයි. එනම් සතිමත් වූ සිතින් පටිච්චසමුප්පන්නාදි වශයෙන් ධර්මය ගැඹුරින් නුවණින් විවිධාකාරයෙන් විමසා බැලීම නිසා ධම්මවිචය සම්බොජ්ඣංගය පරිපූර්ණත්වයට පත්වීමයි. මෙලෙස දහම නුවණින් විමසා බලන කල්හි ධෛර්යවත්ව ධර්ම මාර්ගයෙහි ඉදිරියට වීර්යයක් ඡන්දයක් හටගනී. විරිය සම්බොජ්ඣංගය පරිපූර්ණත්වයට පත්වන්නේ මේ අයුරිනි. මෙසේ අකුසලයෙන් දුරුව වීර්යෙන් කුසලයෙහි දැඩිව යෙදෙන කල්හි නිරාමිස ප්‍රීතියක් හටගනී. එය පීති සම්බොජ්ඣංග නම් වේ. ඒ අනුව පීති සම්බොජ්ඣංගය වඩයි. එවිට එම තැනැත්තාගේ පීති සම්බොජ්ඣංගය භාවනාවෙන් පරිපූර්ණත්වයට පත් වෙයි. ප්‍රීති සිත් ඇත්තාගේ මනස ද සිත ද සන්සිඳෙයි (***පීතිමනස්ස කායොපි පස්සම්භති, චිත්තම්පි පස්සම්භති***). මෙලෙස මනස හා සිත සන්සිඳුණු කල්හි ඔහුගේ පස්සද්ධි සම්බොජ්ඣංගය වැඩෙයි. එනම් කයෙහි සැහැල්ලු භාවය නම් වූ පස්සද්ධි සම්බොජ්ඣංගය පරිපූර්ණත්වයට පත්වීමයි. කය සැහැල්ලු වූ කල්හි සිත සමාධිමත් වීම් වශයෙන් සමාධි සම්බොජ්ඣංගය වැඩෙයි. එකල්හි සමාධියෙහි පරිපූර්ණත්වයට පත් වෙයි. ***‘සමාහිතො භික්ඛවේ යථාභූතං පජානාති’*** යනුවෙන් දක්වා ඇති පරිදි සිත සමාධිමත් වූ කල්හි හේතුඵල දහම්හි අවබෝධයෙන් යුතු සම්මාදිට්ඨිය පෙරටුකොට දහම් වැඩූ ශ්‍රාවකයාට අනිත්‍යාදි වශයෙන් ලෝක යථාර්ථය අවබෝධ වීම නිසා සිත උපේක්ෂාවෙහි පිහිටයි. එනම් උපෙක්ඛා සම්බොජ්ඣංගය වැඩී

